# 19 වන සියවසේ බෞද්ධාගමික පුනර්ජීවන - ව්‍යාපාරය ප්‍රොතෙස්තන්ත රෙපරමාදු ආගම අනුකරණය කිරීමක් ද?

අජිත් තල්වත්ත

බ්‍රිතාන්‍යය යටත්විජිත පාලනය තුළින් ජනිත වූ ඇතැම් බලපෑම් තවදුරටත් මෙරට සමාජයෙහි ශේෂව පවතී. විශේෂයෙන්ම 19 වන සියවසේ ඇතිවූ බෞද්ධ ප්‍රබෝධය පිළිබඳ අවධානය යොමු කරන විට නොයෙක් අදහස් දක්නට ලැබේ. බෞද්ධ පුනරුදය පිළිබඳ ශාස්ත්‍රීය සංවාදයේ ප්‍රධාන නිර්වචන දෙකක් හඳුනාගත හැකිය. එනම්,

I. බෞද්ධ පුනරුදය ඇතිවන්නේ ක්‍රිස්තියානි ආගමට එල්ල වූ තර්ජනයට එරෙහිව ඉදිරිපත්වන ප්‍රතික්‍රියාවක් වශයෙන් හා
II. යටත් විජිත ව්‍යුහය තුළ සිට මෙම පුනරුදය ඇතිවූ බවයි.

මෑත කාලයේ නොයෙකුත් මතවාදයන් පිළිබඳ අදහස් දැක්වූ මානව විද්‍යාඥයින් (ගනනාථ ඔබේසේකර, තම්බයියා, ගොම්බ්‍රිච්) බොහෝ දෙනෙකු කථා කරන්නේ ඉහත පදනම තුළ එම අදහස් ගෙනහැර පෑම සඳහා මූලික වශයෙන් භාවිතා කරනු ලබන්නේ මැක්ස්වේබර් නම් සමාජ විද්‍යාඥයා විසින් ආගම පිළිබඳ දැක්වූ සංකල්ප ක්‍රිස්තියානි ආගම ගැනත් අද සමාජය විසින් පිළිගන්නා මත පිළිබඳවත් මොහු සිය මතවාදය ඉදිරිපත් කරන්නේ Pretastamt Ethic and the Sprit of Capitalism යටතේය.

ඉහත මතවාදය තුළින් 19 වන සියවසේ අග කාලයේ දී බුදුදහම රෙපරමාදුකරණය වී පසුව බෞද්ධ පුනරුදය ඇතිවූ බව මානව විද්‍යාඥයින් විසින් පෙන්වා ඇත. මෙයින් ඔවුන් වඩාත් අවධාරණය කරන්නේ ක්‍රිස්තියානි අනුකරණය කිරීමට උත්සාහ ගත් බවයි.

ප්‍රොතෙස්තන්ත ආගමට අනුව තමන් විසින්ම විමුක්තිය ඇතිකර

ගැනීමට යොමු වේ. බයිබලය කියවීම තුළින් දෙවියන් සමඟ සබඳතා ඇතිකරගත හැකි බව පෙන්වයි. එනමුත් මෙම මතය හා එකඟ විය හැකිදැයි විස්තරාත්මකව විමසා බැලිය යුතුය. 19 වන සියවසේ පුනරුදයේ ස්වභාවය පිරික්සීමට පෙර රාජ්‍ය සහ ආගම අතර සබඳතාවය පිළිබඳ නූතන ඉතිහාසයේ ඇති මතවාදයන් ප්‍රථමයෙන් හඳුනාගත යුතුය.

යුරෝපීය ප්‍රබුද්ධත්වය තුළින් ඉස්මතු වන කාරණයක් වන්නේ රජය සහ ආගම අතර සබඳතාවයක් නොතිබිය යුතු බවකි. ප්‍රබුද්ධත්වයේ සංකල්පය අනුව රජය යනු ලෞකික දෙයක් වන අතර ආගම පෞද්ගලික දෙයකි. ප්‍රබුද්ධත්වය බුද්ධිමය වශයෙන් වර්ධනය වී ව්‍යාප්ත වන්නේ මධ්‍යතන යුගයේ දී කතෝලික ආගමට එරෙහිවය. ඒ තුළින් ඉදිරිපත්වන ප්‍රධාන න්‍යාය වූයේ රජය ලෞකික හා ආගම පෞද්ගලික වියයුතු බවයි. යටත් විජිත සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ දී මෙම සිද්ධාන්තය තදින්ම බලපා ඇත.

ශ්‍රී ලංකාවේ 19 වන සියවසේ ඇතිවූ ආගමික පුනර්ජීවන සංවාදයේ ප්‍රධාන තර්කය වන්නේ යුරෝපීය ක්‍රිස්තියානි ආගමට විරුද්ධව පැන නැගින ප්‍රතික්‍රියාවන් බව පෙන්වා ඇත. ක්‍රිස්තියානි ආගමෙන් බෞද්ධාගමට නොයෙක් තර්ජන තිබුණි. එයට මුහුණදීම පිණිස බෞද්ධාගමට නොයෙක් ආකාරයේ උපක්‍රම භාවිතා කළේය. නමුත් මෙහිදී පැන නැගින ගැටළුව වන්නේ එය ක්‍රිස්තියානි ආගමට එරෙහිව කරනු ලබන සංවාදයක් ලෙස හඳුනා ගැනීමයි.

"ආගම" යන වචනය භාවිතයට එන්නේ ඉතාමත් මෑත අවධියක සිටය. කිත්සිරි මලල්ගොඩ මහතා පෙන්වා දෙන්නේ ආගම යන වචනය ප්‍රථම වරට භාවිතා වූයේ කෝට්ටේ යුගයේ VI වන පරාක්‍රමබාහු සමයේ දී "බෞද්ධාගමේ චක්‍රවර්තී" නැමැති විරුද්ධතාවය බෙංගෝලි ජාතික බ්‍රාහ්මණයකුට පිරිනැමීමත් සමඟය. මොහු බෞද්ධාගම පිළිබඳ හැදෑරූ නිසා ඊට ගරුකිරීමක් වශයෙන් එම විරුදාවලිය ඔහුට ලබාදී ඇත. මෙයින් ගම්‍ය වන්නේ මේ විරෝධතාව ක්‍රිස්තියානිය සම්බන්ධයෙන් පැමිණි එකක් නොව ඊට පෙරද භාවිතා වූ බවයි. ඒ වගේම

ලන්දේසි පාලන සමයේ දී කතෝලිකයන්ට අත්විඳීමට සිදුවූ හිරිහැරවල දී උඩරට රාජධානියෙන් නොමද ආරක්ෂාව ලැබුණි. ගොන්සාල්වේස් වැනි පූජකතුමකුගේ ක්‍රියාකාරිත්වය නිසා වහකෝට්ටේ වැනි ප්‍රදේශවල ජනපද පවා ඇතිකරනු ලැබීය. එහිදී ආගම යන වචනය භාවිතා කර ඇත. යටත්විජිත සමයේ බෞද්ධාගම ගැන ලියූ ඇමෙරිකානු ජාතික ඩෙවිට් ස්කොට් ඉදිරිපත් කරන තර්කය වන්නේ ආගම බෞද්ධයන් විසින් ක්‍රිස්තියානි ලබ්ධියෙන් ලබාගත් වචනයක් බවයි. නමුත් එවකට ක්‍රිස්තියානි පූජකවරු බෞද්ධාගම හැඳින්වීම සඳහා ආගම යන වචනය භාවිත කර ඇත. කිත්සිරි මලල්ගොඩගේ මතවාදය හා බලන විට ආගම යන වචනය ක්‍රිස්තියානියේ භාවිතයට පෙරද දක්නට ලැබුණු බව පෙනේ.

පසුකාලයේ දී ක්‍රිස්තියානි ආගම අනුගමනය කරමින් බෞද්ධාගමේ පිළිගැනීම් මාලාවක් ඉදිරිපත් කර එයට විරුද්ධව ආගම ඉදිරියට එන අතර එහි ප්‍රධාන වැදගත්කම වන්නේ ක්‍රිස්තියානි ලබ්ධිය ව්‍යාප්ත වූ පසුව බුද්ධාගම ආගමක් ලෙස ඔවුන්ගේ පිළිගැනීමට භාජනය වීමයි. මේ අනුව බෞද්ධාගම පැහැදිලි ඉගැන්වීමක් ඇති ආගමක් ලෙස පිළි ගැනීම ක්‍රිස්තියානිය තුළින් බෞද්ධ සමාජය තුළ වර්ධනය වේ. "බෞද්ධ සමාජය" යන වචනය වර්ධනය වී බෞද්ධ පුනරුදය ඇතිවේ. බෞද්ධ සමාජය වර්ධනය වීම හේතු කොටගෙන පසු අවදියේ රජය යන අදහස වර්ධනය වී බෞද්ධාගමට දේශපාලන අනන්‍යතාවය ලැබී ඇත.

බ්‍රිතාන්‍යය පාලනය යටතේ රාජ්‍ය සහ ආගම අතර සබඳතාවය හඳුනා ගැනීමේ දී දක්නට ඇති ප්‍රධාන මතවාදය වන්නේ පෘතුගීසි, ලන්දේසි අවදිවල මෙන් නොව ආගමික නිදහස ජනතාවට ලබාදුන් බවයි. නමුත් මෙම මතය පිළිගැනීමට අපහසුය. යටත් විජිතවාදය ඉතා කිට්ටුවෙන් ක්‍රිස්තියානි ආගම හා බැඳී තිබුණි. මූලික වශයෙන් යටත් විජිතවල නිල වශයෙන් ආගම බවට පත්වූයේ එයයි. නෝර්ත් ආණ්ඩුකාරවරයා නිකුත් කළ නිර්දේශවල පවා මෙම ලක්ෂණය ගැබ්ව ඇත. ඉන්දියාවේ මෙන් නොව 1802 බ්‍රිතාන්‍යය රජය බලය පිහිටුවීමෙන් අනතුරුව ලංකාවේ ක්‍රිස්තියානි ආගම ව්‍යාප්ත කිරීමට රජය මැදිහත්

විය. ඒ අනුව නෝර්ත් තෝමස් මේට්ලන්ඩ්, රොබට් බ්‍රවුන්රිග් වැනි අය ආගම ප්‍රචාරය කිරීම ඔවුන්ගේ වැදගත් අරමුණක් ලෙස පිළිගනී. 1815 ගිවිසුම මගින් බෞද්ධාගමික වත් පිළිවෙත් ආරක්ෂා කිරීම සඳහා රජය විසින් ක්‍රියාමාර්ග ගනු ලැබුවත් 1818 දී ඉංග්‍රීසින්ට විරුද්ධව ගෙනගිය සටන ඉතා දරුණු ලෙස මර්දනය කළ ඉංග්‍රීසිහු තම අභිමතය පරිදි උඩරට ගිවිසුම වෙනස් කොට අලුත් ප්‍රකාශයක් නිකුත් කළහ.

එම ප්‍රකාශය අනුව බුද්ධාගමට උඩරට රාජ්‍ය තුළ වූ විශේෂ ස්ථානය අහිමි විය. රජයේ අනුග්‍රහය යටතේ විවිධ මිෂනාරි කණ්ඩායම් දිවයිනට පැමිණ පල්ලි, පාසැල් ඉදිකිරීම මගින් ලාංකික බාල පරම්පරාව කඩිනමින් හා සූක්ෂම අන්දමින් ක්‍රිස්තියානි ආගමික නිකායන්ට හරවා ගැනීම නිසා බෞද්ධාගමත්, බෞද්ධ භික්ෂූන් වහන්සේලා ඇතුළු සිද්ධස්ථානත් පිරිහෙන්නට විය. ඒවා එසේ පිරිහීමට පත්වූයේ ප්‍රධාන වශයෙන් රාජ්‍ය අනුග්‍රහය නොලැබීම නිසා බව රහසක් නොවේ.

බෞද්ධ ජීවන රටාවේ මළ බෙරය වැයී දශක තුන හතරක් ගෙවීමට පෙර බෞද්ධ දර්ශනයේ ඉපදීමක් නැවත දක්නට ලැබුණි. 1860 පමණ කාලයේ සිට අභිමානවත් දේශීය උගතුන් යටතේ ආරම්භ වූ සිංහල බෞද්ධ පුනර්ජීවය හමුවේ අධිරාජ්‍යවාදීහු හා අන්‍ය ආගමික මිෂනාරිවරු බියට පත්වූහ. මෙහි අවසාන ප්‍රතිඵලය වූයේ දෙපාර්ශ්වය අතර අන්‍යෝන්‍ය විරුද්ධතා ගොඩනැඟීමය. බුද්ධාගමේ එන ඇතැම් ප්‍රධාන ඉගැන්වීම් අසත්‍ය බව පෙන්වීමටත්, සංඝයා වහන්සේලාට අගෞරව කිරීමටත් ක්‍රිස්තියානි පූජකවරුන් ක්‍රියා කිරීම හේතුකොට සිංහල බෞද්ධ ගිහි පැවිදි නායකයෝ ද එකී අසත්‍ය ප්‍රචාර සහ චෝදනාවලට පිළිතුරු දීම සඳහා පොත්පත් මුද්‍රණය කිරීමටත් වාද විවාද පැවැත්වීමටත් පටන් ගත්හ.

ආගම යනු ලෝකෝත්තර සුභ සිද්ධිය සඳහා ඉදිරිපත් කරන ඉගැන්වීම් මාලාවක් පමණක් නොව ලෞකික කටයුතු ද ඊට අයත් වේ. බෞද්ධ පුනරුදය යටත් විජිතවාදය සමඟ එකට බැඳී ඇති වූ දෙයක් නොවේ. විශේෂයෙන්ම 18 වන සියවසේ දෙවන භාගයේ දී මහනුවර රා-

ජධානි සමයේ, වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ හිමියන්ගේ පුරෝගාමිත්වයෙන් ඇති වූ දෙයකි. සංඝරාජ සමයේ ඇතිවන බෞද්ධ පුනර්ජීවය බෞද්ධාගමේ ඉගැන්වීම්වල පුනර්ජීවයක් පමණක් නොව බුද්ධාගම නැවත පිහිටුවා සංඝ ශාසනයේ පාරිශුද්ධත්වය ඇති කිරීමක්ද විය. සියමයෙන් උපසම්පදාව ගෙන්වා නැවත පිහිටුවා ශාසනාභිවෘද්ධිය එකල ඇතිවිය. එම අවධියේ පහතරට බෞද්ධ වත්පිළිවෙත් ආරක්ෂා කරමින් ගණින්නාන්සේලා ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කළහ. සංඝරාජ හිමියන්ගෙන් ඇති වූ ශාසනික ප්‍රබෝධය උඩරට සිට පහත රටට ගොස් වඩාත් විචිත්‍ර වන්නට විය. 19 වන සියවස ආරම්භ වන විට උඩරට ඇති වූ ශාසනික පරිහානිය තුළ පහත රට කේන්ද්‍ර කරගෙන ඇතිවන බෞද්ධ ප්‍රබෝධයේ තෝතැන්නක් වූයේ පහත රට ප්‍රදේශයයි. පහත රට ප්‍රබෝධයේ වේහැල්ලේ ධම්මදින්න හිමියන් සහ මුල්කිරිගල ආදී පන්සල් වලින් ඉටුවේ. එබැවින් බෞද්ධ පුනරුදය 19 වන සියවසේ නොව, මහින්දාගමනය සිදු වූ අවධියේ සිටම ඇති වූ බව පෙනේ.

මුලින් පෙන්වා දුන් පරිදි ප්‍රොතෙස්තන්ත බෞද්ධ පුනරුදය පිළිබඳව අදහස් දක්වූ මානව විද්‍යාඥයින් පවසන්නේ 19 වන සියව-සේ ඇති වූ බෞද්ධ පුනරුදයේ ගිහි නායකත්වයක් ඇති වූ බවයි. ගිහි නායකත්වය රෙපරමාදු ආගමේ පූජකවරුන්ගේ අනුකරණයක් ලෙස පෙන්වා දේ. එම ආගම බ්‍රහ්මචාරී නොවේ. සාමාන්‍ය ජීවිතයක් ගත කරති. ගිහි ජීවිතයේ සිට ආගමික කටයුතුවල නිරත වෙති. ගිහි නායකත්වය බුද්ධාගමට අලුත් දෙයක් නොවේ. එය පූජකයා අනුකරණය කිරීමක් ලෙස සැලකිය නොහැකිය. විශේෂයෙන් මේ සඳහා මානව විද්‍යාඥයින් භාවිතා කරනු ලබන්නේ අනාගාරික ධර්මපාල, ඕල්කට්තුමා වැනි ජාති හිතෛෂී අයගේ ක්‍රියාකාරිත්වය යි. මානව විද්‍යාඥයින් බොහෝ දුරට එය යුරෝපීය කේන්ද්‍රීය දෘෂ්ටි කෝණයකින් හුවා දක්වීමට උත්සාහ ගෙන ඇත. 19 වන සියවසට පෙර අවධියේ සිට ගිහි නායකත්වය වඩාත් කැපී පෙනේ. එනම් ශාසන විලෝපන අවදියේ බෞද්ධ වත් පිළිවෙත් ආරක්ෂා කරමින් ගණින්නාන්සේලා විසින් ප්‍රසංශනීය කාර්ය භාරයක් ඉටු කරන ලදී. උන්වහන්සේලා උපසම්පදාව නොලැබුව ද දුශ්ශීලව නෙ-

ාසිටි අතර ඒ පිළිබඳව ඉතිහාසයේ සඳහන් නොවේ. ලන්දේසි බලපෑම නිසා ආගමික ජීවිතයක් ගත කිරීමට ගණින්නාන්සේලාට නොහැකි විය. මෙම අවදියේ පහත රට වේහැල්ලේ ධම්මදින්න හිමියන් මඟින් ඇතිවන ප්‍රබෝධය නිසා ආඩීන් සතුව තිබූ ශ්‍රී පාදස්ථානයේ අයිතිය පසුව තහවුරු කරගෙන ඇත. උඩරට හා පහත රට ඇතිවන බෞද්ධ ප්‍රබෝධයේ විශේෂ ලක්ෂණයක් වන්නේ විනාශයට පත් වූ පන්සල් නඟා සිටුවා බුද්ධ ශාසනය නඟා දියුණු කිරීමයි. ගණින්නාන්සේලා පමණක් නොව ගිහි සමාජයෙන් ද නොමද සහයක් ලැබුණි. මෙහිදී සාමාන්‍ය ජනතාවට වඩා ග්‍රාමීය ප්‍රභූ පවුල්වල දරුවන් සසුනට පූජා කිරීමත් එයින් ප්‍රභූ පිරිස්හට ඉදිරියට ඒමටත් හැකිවිය.

බොදු පුනරුදය සඳහා විශාල වශයෙන් අනුග්‍රහයක් පහත රට ප්‍රභූ පන්තියෙන් ලැබුණු බව මානව විද්‍යාඥයින් විසින් පෙන්වා දෙයි. අලුතින් ධනවත් වූ ප්‍රභූ පන්තිය මේ පිරිසට අයත් වේ. මානව විද්‍යාඥයා යම්කිසි න්‍යායක් තුළින් එය පැහැදිලි කිරීමට උත්සාහ ගත් බව පෙනේ. යටත් විජිතවාදය මගින් පෙරළියක් ඇති වන්නේ වාණිජ ධනේශ්වර කොටස් ඉදිරියට ඒමත් සමඟය. විශේෂයෙන්ම පහත රට, සලාගම, කරාවේ, දුරාවේ යන කුල පිරිස් ඉදිරියට ඒමක් දක්නට ලැබිණි. සාම්ප්‍රදායික කුල ධූරාවලිය තුළ මෙම කුලයන් සඳහා ප්‍රමුඛත්වය නොලැබුණු බැවින් සමාජ තත්ත්වය ආරක්ෂා කර ගැනීම සඳහා රැකුලක් වශයෙන් බෞද්ධ පුනරුදයට ඔවුන්ගේ නායකත්වය ලබා දී ඇත. අනගාරික ධර්මපාල වැනි අය වාණිජ පන්තිය තුළින් ඉදිරියට පැමිණි අය වේ. වාණිජ පන්තිය බෞද්ධ පුනරුදයට සහය දුන්නත් එය සෑම තැනකටම ගැළපෙන්නේ නැති බව මේ අනුව සිතිය හැකිය.

18 වන සියවසේ ආගම පිළිබඳ බලනවිට ඒ කාලයේ සමාජ තත්ත්වය හා ඒ තුළින් බෞද්ධ පුනරුදය ඇති වූ බවට අවධානය යොමු කළ යුතු අතර 19 වන සියවසේ පුනරුදය ගැන සළකන විට වාණිජ පන්තිය තුළ සිටියේ සාම්ප්‍රදායික වශයෙන් පහත් යැයි සැලකූ පුද්ගලයන්ය. සමාජ පිළිගැනීමක් අවශ්‍ය නිසා පුනරුදයට සහාය ලබා

දෙයි. 18 වන සියවසේ ඇතිවන ආගමික පුනර්ජීවනයේ පැහැදිලි කුළ ගැටීමක් නොවන නමුත් සමාජ විද්‍යාඥයින්ගේ මතවාදය ඊට වෙනස් වේ. ලංකාවේ නිකාය භේදය ඇතිවන්නේ 19 වන සියවසෙන් පසුවය. මුල් අවදියේ කුලයට වඩා භික්ෂු විනය ගරුත්වය හා ධර්ම ඥානය හැකි පමණ දියුණු කිරීමට උත්සාහ ගත්තේය. අමරපුර, රාමඤ්ඤ හා සියම් නිකායයන් ආරම්භ වන්නේ පසුවය. නමුත් මෙය ක්‍රිස්තියානි විරෝධී ක්‍රියාවක් නොවේ. ක්‍රිස්තියානියට පහර ගැසීමට වඩා භික්ෂූන් බෞද්ධාගමේ පුනර්ජීවයට කටයුතු කරනු ලැබේ. නමුත් අපට පෙනී යන්නේ බෞද්ධාගමේ හා ක්‍රිස්තියානි ආගමේ එතරම් දුරට ආගමික මතගැටුම් මුල් අවධියේ දක්නට නොලැබුණ ද ක්‍රිස්තියානි ආගම දුර්වල කිරීමේ ව්‍යාපාරය ආරම්භ වන්නේ 19 වන සියවසේ දී බව කිත්සිරි මලල්ගොඩ මහතා විසින් පෙන්වා දී ඇත. රොබට්ස් නොක්ස්, කෘරෝස් වැනි අය පෙන්වීමට උත්සහ ගන්නේ බෞද්ධයන් ඇවිස්සීමට නොහැකි පිරිසක් ලෙසය. බෞද්ධයන් ප්‍රතික්‍රියාවන් ක්‍රිස්තියානි ආගම සතුරු ආගමක් ලෙස නොසැලකූ බව ඔහු පෙන්වා දෙයි. මෙයින් ගම්‍ය වන්නේ බෞද්ධයන් හා කතෝලිකයන් අතර යහපත් සම්බන්ධතාවයන් පැවති බවයි. 19 වන සියවසේ මුල් අවධියේ ආගම ප්‍රචාරය කිරීම සඳහා මිෂනාරීන් ගම ගිය විට ඔවුන් නතර වී සිටියේ ගමේ පන්සලේය. ඇතැම් අවස්ථාවල භික්ෂූන් විසින් බයිබලය පරිවර්තනය කළ අවස්ථාවන් ද හඳුනාගත හැකිය.

මානව විද්‍යාඥයින් පෙන්වා දෙන්නේ බ්‍රිතාන්‍ය පාලනය යටතේ බුද්ධාගමේ බලයත් එහි කීර්ති නාමයත් පිළිගැනීම සම්පූර්ණයෙන්ම නැති වී ගිය බවයි. නමුත් මෙය මතභේදයට ලක්වන කරුණකි. මෙය එකහෙළාම පිළිගැනීමට නොහැකිය. උඩරට ගිවිසුමට අනුව භික්ෂූන් වහන්සේලා තනතුරු වලට පත්කරයි. නමුත් අවසාන කාලයේ ක්‍රිස්තියානි මිෂනාරීන්ගේ චෝදනාව වන්නේ ඇද වැටෙන ආගමකට රජය මුක්කු ගහන බවයි. යටත් විජිතවාදය සහ බුද්ධාගම අතර සම්බන්ධතාවය සංකීර්ණ වූවක් බැවින් එය වෙනම සාකච්ඡා කළ යුත්තකි.

මලල්ගොඩ මහතා පෙන්වාදෙන ආකාරයට බෞද්ධ විරෝධී

භාවය ඇතිවන්නේ 1840 න් පසුවය. බෞද්ධාගම සම්බන්ධයෙන් පූජකවරු දරූ ආකල්පය වෙනස් වේ. බුද්ධාගම ආගමක් ලෙස පූජකවරු සලකති. එනිසා බෞද්ධයන් ඉදිරියට පැමිණ ඊට විරුද්ධව තර්ක ඉදිරිපත් කරනු ලැබේ. පසුව එය තරමක ක්‍රිස්තියානි විරෝධී භාවයක් බවට පත්වේ. භික්ෂූන් වාද විවාද (පංචමහා වාද) පවත්වා ක්‍රිස්තියානිය බොරු බවට පෙන්වා ඇත්තේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. මේ තත්ත්වය තුළ දෙස් විදෙස් වශයෙන් විශාල විද්වතුන් පිරිසක් පැමිණ බුදු දහම වැළඳ ගනී.

මෙම කාලයේ බටහිර ක්‍රිස්තියානි දර්ශනයට එරෙහිව බුද්ධිමය මතවාද විද්‍යාවේ දියුණුවත් සමඟ ඇති වේ. එකල පොත්පත් රාශියක් ලියනු ලැබේ. ක්‍රිස්තියානි ආගමට බටහිරින් එල්ල වූ තර්ජනය ලංකාවේ දී භාවිත කරනු ලැබේ. 19 වන සියවසේ ලංකාවේ ආරම්භ වූ බෞද්ධ පුනරුදයේ විශේෂ ලක්ෂණය වන්නේ පෘතුගීසි, ලන්දේසි යුගයේ විනාශයට පත්වූ වෙහෙර විහාර, පන්සල් ගොඩනඟා බෞද්ධ සමාජය නැවත ස්ථාපිත කිරීමයි. මෙය කාලයක් තිස්සේ වර්ධනය වී හටගත් ප්‍රබෝධයකි. බෞද්ධාගමේ පුනරුදය යනු භික්ෂූන්, පන්සල් පමණක් නොව සමස්ත සමාජයේම ඇති වූ ප්‍රබෝධයකි.

සමාජ විද්‍යාඥයින් විසින් බෞද්ධාගම දර්ශනයක් ලෙස පෙන්වීමට උත්සාහ ගනී. නමුත් මෙය ආගමක් බවට පරිවර්තනය වී ඇත. බුදුන් පහල වූ අවදියේ සිටම බෞද්ධාගමක් පුද පූජා ක්‍රමයක් බිහි වී ඇත. මෙහි විශාල ආයතනික ව්‍යුහයක් පැවති· අතර එය පුනර්ජීවය කිරීමේ කාර්ය මුලින්ම සිදුවේ. ඕල්කට්තුමා වැනි අය මෙරටට පැමිණ බුද්ධාගමේ හරය පිළිගනී. ධර්මපාලතුමා පවා මෙම අවදියේ පරම විඥානාර්ථ සංගමයේ ඇතැම් අදහස් සමග එකඟ නොවූ බව ප්‍රකට කරුණකි. නොයෙක් ආගම්වල දාර්ශනික අදහස් එකතුකර එම හරය පිළිපදින පිරිසක් බිහිකිරීමට අරමුණ ඇතිව ක්‍රියා කළත් බෞද්ධ නායකයන් එයට විරුද්ධ නැඟී සිටි බව පෙනේ.

මානව විද්‍යාඥයින්ගේ දක්වන තවත් මතයක් වන්නේ පුද්ගලයා

නිවන් දැකීමේ මාර්ගයට ප්‍රවේශවීම සඳහා භික්ෂුවගේ මැදිහත්වීම නොමැතිව කළ හැකි බව ප්‍රකාශ කිරීම රෙපරමාදු ආගම අනුකරණය කිරීම තුළින් ඇති වූ බවයි. රෙපරමාදු ආගමට පූජක පන්තිය අවශ්‍ය නැති බව මාටින් ලූතර් පවසයි. භක්තිය තුළින් දෙවියන් සමඟ සම්බන්ධ විය හැකිය. බයිබලයේ පවසන ආකාරයට දෙවියන් සමග සම්බන්ධව ක්‍රියාකළ හැකි වේ. මෙම අවදිය වනවිට සංඝයාගේ කාර්ය වෙනස් වේ. නව සමාජයට භික්ෂුව අවශ්‍ය නොවේ. තමන්ගේ විමුක්තිය ලබාගැනීමට පොත පතේ දැනුම තුළින් කටයුතු කරයි. මෙම පිළිගැනීම රෙපරමාදු ආගමේ ඇති අතර එහි වැරැද්දක් නැත. සංඝයාගේ මැදිහත්වීම බුද්ධාගමේ මූලික ඉගැන්වීමක් නොවේ. මානව විද්‍යාඥයින් උත්සාහ ගත්තේ සම්ප්‍රදාය හා වෙනස්වීම් පිළිබඳ සොයා බැලීමටයි. නමුත් සම්ප්‍රදාය වෙනස් නොවේ. පවතින දේ සමාජ අවශ්‍යතා අනුව ඉස්මතු වේ.

මානව විද්‍යාඥයින් පෙන්වාදෙන ආකාරයට මෙම අවදියේ ගිහියන් සඳහා ඉදිරිපත් කරන චර්යා ධර්ම රෙපරමාදු ආගමේ චර්යාවන් අනුගමනය කිරීමක් ලෙස පෙන්වීමට උත්සාහ ගනී. රෙපරමාදු ආගමේ ඉගැන්වීම්වලට අනුව ගිහියා අල්පේච්ඡ ජීවිතයක් ගත කළ යුතුය. දෙවියන් වහන්සේගේ ප්‍රසාදය දිනාගැනීමට හැකි ආකාරයට ස්වකීය ජීවිකාව පවත්වා ගැනීම අවශ්‍ය වේ. ස්වර්ගයට යෑමට නම් දෙවියන්ගේ ප්‍රසාදය දිනාගත යුතුය. උපයන මුදල් නැති නාස්ති නොකර නැවත ආයෝජනය කළ යුතුය. මෙම ක්‍රමය නිරීක්ෂණය කළ මැක්ස් වෙබර් පවසන්නේ එමඟින් ධනවාදය වර්ධනය වන බවයි. ධනවාදය හා රෙපරමාදු ආගමේ පුද්ගල චර්යා අතර සම්බන්ධයක් ඇති බව වෙබර් පවසයි. නමුත් ධනවාදය විසින් රෙපරමාදු භක්තිය තහවුරු වන රටවල මෙම තර්කය පිළිනොගනී.

මෙම අවදියේ බිහිවූ ඇතැම් සංවිධාන රෙපරමාදු ආගම අනුකරණය කිරීම තුළින් ආරම්භ වූ බව කියැවේ. සර්වඥ ශාසනාභිවෘද්ධි ධර්ම සභාව නම් ආයතනයක් මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් විසින් පිහිටවනු ලැබේ. නමුත් මෙය ක්‍රිස්තියානිය අනුකරණය කිරීමක් නොවේ. මෙම මතය ප්‍රකාශ කිරීමට හේතු වූයේ Society Propagation

of the Gospel නම් ඇන්ගලිකන් සභාවේ ව්‍යාපාරය අනුකරණය කිරීමක් ලෙස කියයි. මෙම අදහස ගුණානන්ද හිමියන්ගේ ව්‍යාපාරයට සම්බන්ධ වන්නේ නැත. මෙම සංවිධානය බුද්ධාගමට පමණක් සීමා නොවී ග්‍රාමීය වශයෙන් ප්‍රචලිත වී වර්ධනය සඳහා ක්‍රියාත්මක විය. බෞද්ධාගම තුළ මෙවැනි සංවිධාන ආරම්භ වූයේ මෙම සියවසේ දී පමණක් නොව ඊට පෙර සරණංකර සංඝරාජ හිමියන් විසින් නියම කත්දේ සිල්වත් සමාගම ආරම්භ කිරීම නිසා ද එවැනි ව්‍යාපාර බුද්ධාගමට අළුත් දේ නොවේ.

ඒ වගේම ඉරිදා දහම් පාසල් පැවැත්වීම ක්‍රිස්තියානියට එරෙහිව භාවිත කළ බව ප්‍රකාශ වුවද එය පිළිගැනීමට නොහැකිය. එනම් පෙර අවදියේ සිටම ගිහිපැවිදි දෙපක්ෂයටම පන්සල් ආශ්‍රිතව දැනුම බෙදා දෙන ලදී. 19 වන සියවසේ බෞද්ධාගමේ කටයුතු ප්‍රචාරය පිණිස මුද්‍රණ කටයුතු ආරම්භ කර තිබේ. නමුත් මුද්‍රණාලය ආරම්භ වීමට ප්‍රථම පන්සල් ආශ්‍රිතව භික්ෂූන් විසින් විවිධ ආකාරයේ ග්‍රන්ථ, පුස්කොළ පොත් රචනා කර ඇත. සරණංකර යුගයේ හටගත් ධර්ම ඥානය වඩාත් උද්දීපනය විය. එබැවින් මේවා බුද්ධාගමට නවක දේවල් නොවූ බව සිතිය හැකිය.

බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය මතුපිටින් අධ්‍යයනය කර ඉදිරිපත් කරන තවත් මතයක් වන්නේ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ගේ දේශන ක්‍රමය පූජකයන් අනුකරණය කිරීමක් බවයි. නමුත් මෙම මතයට එකඟ විය නොහැක. මෙම අවදියට පෙර යුගයේ සිට වඩා චතුරත්වයකින් යුත් භික්ෂූන් වහන්සේලා සිටියහ. රෙපරමාදු බුදුදහමේ බාහිර ලක්ෂණ ලෙස බෞද්ධ කොඩිය භාවිතය, ක්‍රිස්තියානි ගීතිකාවලට සමාන බෞද්ධ ගීතිකා ගායනය කිරීම, ඉරිදා දහම් පාසල් ඇතිවීම, විවිධ බෞද්ධ සංවිධාන කිරීම යනාදිය බටහිර සමාජය අනුකරණය කිරීමකින් තොරව අනාදිමත් අවදියක සිට මෙරට සමාජයේ පැවති අංගයන් වේ.

ලංකාවට බුදුදහම ලැබීමෙන් පසු ආගමික හික්මීම මත ගොඩ නැඟී තිබූ මෙරට සමාජ ක්‍රමය හා සංස්කෘතිය ප්‍රබල විපර්යාශයකට

ලක්වීම බ්‍රිතාන්‍ය යුගයේ දී සිදුවිය. නමුත් ශ්‍රී ලාංකික අනන්‍යතාවය රැක ගැනීමට එකල ජනයා පෙළ ගැසුණහ. විශේෂයෙන්ම 19 වන සියවසේ බෞද්ධාගමික ප්‍රබෝධය රෙපරමාදු කතෝලික ආගම අනුකරණය කිරීම තුළින් වර්ධනය වූ බවට ඇතැම් ශාස්ත්‍රඥයින් පෙන්වීමට උත්සාහ ගෙන තිබේ. නමුත් මෙම මතවාදය එකහෙළාම පිළිගැනීමට නොහැකි ය. අනාදිමත් කාලයක සිට උරුමව තිබූ අපටම අනන්‍ය වූ ක්‍රමවේදයන් ඔස්සේ මෙම අවදියේ බෞද්ධාගමික පුනර්ජීවනය සිදුවිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


1. රාහුල වල්පොල, භික්ෂුවගේ උරුමය, ගොඩගේ සහෝදරයෝ කොළඹ, 1992
2. නොක්ස්, රොබට්, එදා හෙළදිව, එච්. කරුණාරත්න ගුණසේන සහ සමාගම, කොළඹ. 1997
3. ඉලංගසිංහ, මංගල, රාජ්‍ය හා ආගම, කැළණි විශ්ව විද්‍යාලයේ ප්‍රකාශනයකි.
4. කිරිඇල්ලේ ඥාණවිමල, වෙහැල්ලේ ශ්‍රී ධම්මදින්න, ශාසන ඉතිහාසය ගොඩගේ සහෝදරයෝ, කොළඹ. 1995
5. Malagoda, K. The Buddhist Christion Confrontation in Ceylon
6. Silva K. M. Social policy and Missionary Organization in Ceylon
7. Jayasekera P. V. J. Temperance and Nationalism in Sri Lanka. Kalaniya